පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492

Name of the institution: Ministry of Justice and National Integration

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඇගයීම -2023 මුදල් වර්ෂය

<u>අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුවේ නම</u>	<u>ශීර්ෂය</u>
1. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	110
2. අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව	228
3. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	234
4. නීතිපති දෙපාර්තමේන්තුව	229
5. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	230
6. බන්ධනාගාර දෙපාර්තමේන්තුව	332
7. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	233
8. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	236
9. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව	231
10. නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	235
11. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	326

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනය - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කමිටුව මගින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මගහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස : 97.00	
පුද්ගල පඩිනඩි ලේඛණය පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පුද්ගල පඩිනඩි ලේඛණය යාවත්කාලීන ලෙස පවත්වා ගෙන ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේදී මෙම තත්වය නිවැරදි කරගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
සියලු වාහනවල රාජය ලාංඡනය පින්තතාරු කර නොතිබුණි.	මේ සඳහා අධිකාරිමය පියවර ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන අපහරණය සඳහා හඳුනා ගැනීමේ කමිටුව පත්කර අපහරණ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	<u>වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ.</u> 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළ සඳහන් වූ වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 05 දෙනෙකගෙන් අයවිය යුතු රු.552,516.68 ක ණය ශේෂ සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය පහත පරිදි වේ. • එම්.අයි.ප්‍රනාන්දු - රු 49,150.00 - හිඟ ශේෂය නිරවුල් කර ඇත. • පී.වී. ගුණවර්ධන - රු.162,215.00 - කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ක්‍රියාත්මක වේ. 2026.07.03 දින නඩුව නැවත කැඳවීමට නියමිතයි.

- ජී.ඒ.සී. ගමආරච්චි - රු.111,832.00 - ණය ශේෂයද දෙවන ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉතිරි මුදල 65,292.00 කි.
- ඒ.එන්.ඒ.සමරනායක - රු. 110,854.68 - කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.
- ජේ.එම්.එස්.කුමාරසිරි - රු. 118,465.00 - ගංගොඩවිල දිසා අධිකරණයේ නඩුවක් ක්‍රියාත්මකවේ, අවසන් නඩු තීන්දුව ලබා දීමට නියමිතය.

<u>සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ.</u>

2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළ සඳහන් වූ වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකගෙන් අයවිය යුතු රු.473,985.00 ක ණය ශේෂ සම්බන්ධයෙන් විස්තර පහත පරිදි වේ.

- එච්.එස්.සී.පුෂ්ප කුමාර - රු.121,392.00 - කොළඹ, සුළු හිමිකම් අධිකරණයේ නඩු ගොණු කර ඇත.
- එච්.ඒ.ඒ. චාමර - රු. 117,003.00 - නීතිමය පියවර ගැනීම සඳහා අදාල තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- වී.එම්.යු.බී.තෙන්නකෝන්- රු. 235,590.00 – නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ණය ගොණුව ලබා ගැනීමට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. සිහිකැඳවීම් ලිපියක් ද යොමු කර ඇත.

<u>මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ.</u>

2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළ සඳහන් වූ වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන මිය ගිය නිලධාරීන් 03 දෙනෙකගෙන් අයවිය යුතු රු.453,246.00 ක ණය ශේෂ සම්බන්ධයෙන් විස්තර පහත පරිදි වේ.

- එම්.එස්. ඩබ්ලිව්.මාරසිංහ - රු.181,300.00 - මරණ පාරිතෝෂිකය අදාල ලේඛණ සකස් කිරීම සඳහා ලේඛණ ඉල්ලුම් කර ඇති අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා හිග ණය ශේෂ

	නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. • ආර්.එම්.වී.විශ්වජිත් - රු.189,177.00 - මරණ පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත. • ඒ.එස්.තිලකසිරි - 82,769.00 - මරණ පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත. ඒ අනුව අත්තිකාරම් " බී " ගිණුමේ හිඟ ණය ශේෂ නිරවුල් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතින බව දන්වමි.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ. 371(5) අනුව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ දින සිට දින 10 ක් ඇතුළත පියවීම සිදුකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ අනුව අත්තිකාරම් ලබා ගන්නා නිලධාරීන් විසින් අත්තිකාරම් ලබා ගැනීමේ අයදුම්පත මගින් දින 10ක් ඇතුළත අත්තිකාරම් පියවන බවත් එසේ සිදු නොවන අවස්ථාවන්හිදී ප්‍රමාදයට හේතුව සනාථ කර වවුචරය පියවීමට ඉදිරිපත් කරන බවත් සහතික කරන අතර දින 10 ඉක්ම වීම සිදු වූ වහාම සිහි කැඳවීම් සිදුකර මුදල් පියවා ගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමේ ක්‍රමවේදය නිසි අධීක්ෂණයකින් යුතුව සිදු කෙරෙන බව දන්වමි.
<u>දෙවැනි කොටස : 83.00</u>	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියයල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් සකස්කර 2026.03.13 දින වන විට අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත.

සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි (1) ඡේදය සහ (1) හි 03 ඡේදය අනුව තවදුරටත් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දන්වා සංශෝධනය කර ඇති බැවින් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත නොවන ලදී.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මේවන විට සමස්ථ කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දීම සඳහා සැලසුම් සකසා ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටයම් / වයාචන මට්ටයම්/ අහිතකර මට්ටයම් විය.	අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනය - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මඟහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස : 85.00	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේදී මෙම තත්වය නිවැරදි කරගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	

සියලු වාහනවල රාජය ලාංඡනය පින්තතාරු කර නොතිබුණි.	මේ සඳහා අධිකාරිමය පියවර ගැනිමට කටයුතු ආරම්භ කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල ගැලපුම් සිදු කරන ලෙසට කලාප මහාධිකරණ ඇතුළු දිවයිනපුරා පිහිටි අධිකරණ වෙත දැනුවත් කර ඇති අතර මේ වන විට එම තත්ත්වය බොහෝ දුරට නිවැරදි කර ගෙන ඇත. අමාත්‍යාංශය මඟින් මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	(see table below)

අනු අංකය	විස්තරය	2023.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත ගෙන එන ණය ශේෂ ප්‍රමාණය (රු)	අයකරගෙන ඇති ණය ශේෂ ප්‍රමාණය (2024,2025,2026 වර්ෂයන්හිදී) (රු)	2026.04.30 දිනට ඉතිරි ණය ශේෂ ප්‍රමාණය (රු)
01.	මියගිය නිළධාරී	3,072,013.33	1,063,074.93	2,008,938.40
02.	විශ්‍රාම ගිය නිළධාරීන්	2,587,134.50	1,845,908.50	741,226.00
03.	වැඩ තහනම් කළ නිළධාරීන්	8,098,058.01	2,627,153.60	5,470,904.41
04.	සේවය හැරගිය නිළධාරීන්	4,925,371.38	1,677,976.68	3,247,394.70
	එකතුව	18,682,577.22	7,214,113.71	11,468,463.51

	මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන්ගේ ලිපිගොණුවල පවතින ගැටළු හේතුවෙන් මරණ පාරිතෝෂිකය හෝ විශ්‍රාම පාරිතෝෂිකය සැකසීමේ ප්‍රමාදයන් පැවතීම, ණයකරුවන්ගේ ණයගොණු පිළිබඳ තොරතුරු සොයාගැනීමේ ගැටළු පැවතීම, විනය පරීක්ෂණ ක්‍රියාත්මක වීම ආදී හේතුන් මත මෙම ණය ශේෂයන් නිරවුල් කරගැනීම ප්‍රමාදවීමට හේතුවී ඇත. නමුත් අධිකරණ කලාපයන්හි පිහිටුවා ඇති හිඟ ණය ශේෂ අයකිරීමේ කමිටුව හරහා මාසිකව ණය අයකිරීමේ ප්‍රගතිය පරීක්ෂාකර සියළුම ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ඒ අනුව මරණ/විශ්‍රාම පාරිතෝෂිතය මඟින් අයකර ගැනීමටත්, ණයකරු/ඇපකරු මඟින් එකවර හෝ වාරික වශයෙන් අයකර ගැනීමටත් කඩිනම් පියවර ගනිමින් පවතින අතර එසේ අයකර ගැනීමට නොහැකි ණය ශේෂයන් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගන්නා ලෙස අධිකරණ කලාප දැනුවත් කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	දිවයින පුරා පිහිටි අධිකරණයන්හි පවතින නඩු කටයුතුවලට අදාළ ඇප තැන්පතු 6000-0-0-1-94 දරන ඇප තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇත. එම නඩු කටයුතු විසඳෙන ආකාරය අනුව, ඇප නිදහස් කරන ලෙස නියෝග ලද පසු නිදහස් කිරීම සඳහා රඳවා ගැනීමට සිදුව ඇත. බොහොමයක් නඩු වසර 15ක් 20ක් වැනි කාලයක් පුරා විභාග වන බැවින් රජයේ ආදායමට බැර කිරීමේ හැකියාවක්ද නොමැත. මෙම මුදල් රජයේ ආදායමට බැර කළහොත්, ආදායමින් ආපසු ලබා ගැනීම සඳහා දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කිරීමට සිදු වන අතර එමඟින් පාර්ශවකරුවන් අපහසුතාවයට ලක් වීම සිදු වේ. තාවකාලික රැඳවුම් (6000-0-0-13-85) ගිණුමේ නඩුවලට අදාළ නඩත්තු හා වන්දි මුදල් රඳවා ඇති අතර, නියෝග නිකුත් කිරීමෙන් පසුව අදාළ රැඳවුම් නිදහස් කිරීමට සිදුවේ. එහිදී වාණිජමය කරුණු පිළිබඳ ඇතිවන ආරවුල්වල අගතියට පත් පාර්ශවයන්ට වන්දි ගෙවීම සඳහා මෙම මුදල් භාවිතා කරනු ලබන බැවින්, ඒ සම්බන්ධ අධිකරණ නියෝග ලැබෙනතෙක් තැන්පතු නිදහස් කළ නොහැක.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට කටයුතු කරනු ලැබේ.

දෙවැනි කොටස : 78.00	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙය ආයතනයක් ලෙස ස්ථාපනය කර නොමැති බැවින් පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තියක් සකස් කර නොමැත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුහුණු පාඨමාලා සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම පමණක් අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් වාර්තා වී නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම : ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මගහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස: 97	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් වාර්ෂිකව අභ්‍යන්තර විගණනයක්

	දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරනු ලබයි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අවධානම් ලේඛණයට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් වේ.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට තත්ත්කාර්ය අතුරු අග්‍රිම මු.රෙ.371 ප්‍රකාරව නිරවුල් කර ගැනීමට කටයුතු කර ඇත.
දෙවැනි කොටස: 95	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ විගණන මතය යටත්ව මට්ටමේ මතයකි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම- නීතිපති දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මඟහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස: 78	
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා සකස් කළ යුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර, 2024, 2025 සහ 2026 වර්ෂ වලට අදාල ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලවකවානුව තුළ සකස් කර ඉදිරිපත් කර ඇත.

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලවකවානුව තුළ සකස් කර ඉදිරිපත් කර ඇත. 2026 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මද නියමිත කාලරාමුව තුල අනුමත කර ගෙන ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මේ වන විට විගණන විමසුම් සඳහා නිසි කාලරාමුව තුල පිළිතුරු ලබා දී ඇත.
අභ්‍යන්තතර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ වන විට විගණන විමසුම් සඳහා නිසි කාලරාමුව තුල පිළිතුරු ලබා දී ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ සම්බන්ධයෙන් මේ වන විට ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා කටයුතු යොදා ඇත.

නිසි පරිදි කටයුතු කර නොතිබුණි.	
මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා බැරකම් වලට එළඹුන අතර, ඉදිරියේදී පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	රු 77,436,859.00 ක හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු යොදා ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	නිලධාරීන් ලබා ගන්නා තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 07 ක් ඇතුළත නිරවුල් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර, මු.රෙ. 371 අනුව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කර ගැනීමට කටයුතු යොදා ඇත.
<u>දෙවැනි කොටස : 50.00</u>	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිළි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මහජනයාට ඇති පැමිණිලි සම්බන්ධ කටයුතු සිදු කිරීමට අදාළව දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කර ඇති Public Petitions Unit (MP) පිළිබඳ තොරතුරු හා පැමිණිලි යොමු කළ හැකි ආකාරය පිළිබඳව දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි Special Units යටතේ වර්තමානය වන විටත් සඳහන් වන අතර, මේ සම්බන්ධ තවත් ඒකකයක් පිහිටුවීමට වර්තමානයේ කටයුතු සිදු කරමින් පවතී. ඒ ඔස්සේ වෙබ් අඩවියෙහි පළ වන තොරතුරු හරහා මහජනයාට ආකාර කිහිපයක් ඔස්සේ චෝදනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙනු ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය අප්‍රමාදව ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවේ සියළු කාර්යයන්හි හා එම කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහළ දායකත්වයක් සපයන සියළුම කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව මෙන්ම කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරික

	වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මකව පවතී. සිවිල් අංශය, අපරාධ අංශය හා රාජ්‍ය නීතිඥ අංශය ලෙස ප්‍රධාන අංශ තුනක් මගින් සිවිල් හා අපරාධ නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි. ප්‍රධාන අංශ තුනෙහි කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ අංශය, සංස්ථා අංශය, ළමා ආරක්ෂණ අංශය, මහජන පැමිණිලි අංශය වශයෙන් විශේෂිත වූ ඒකක පිහිටුවා ඇත.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක වෙමින් පවතී.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් මේ වන විට සකස් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා ලබා දීම සඳහා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මේ වන විට සකස් කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටයම් / වයාචන මට්ටයම්/ අහිතකර මට්ටයම් විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන විගණකාධිපති මතය තත්ත්වාගණනය කල මතයකි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට ආයතනය දැනුවත් කරන ලදී.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයට අදාලව මෙම දෙපාර්තමේන්තුවේ සක්‍රිය සේවයේ නියුතුව සිටි වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු සියලුම නිලධාරීන් සිය වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මගහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස : 97.00	
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වනවිට සංචිත වාහන සඳහා පූර්ව මාසයේ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සෑම මසකම 15 වන දිනට පෙර විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ලොග් පොත් සියල්ල යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
දෙවැනි කොටස : 87.00	
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබුණි.	රා.ප.ච.02/2018(1) හි ඡේද අංක 03 හි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දක්වා ඇති බැවින් සමස්ත කාර්ය මණ්ඩලයට අදාලව කාර්යසාධන ගිවිසුම් සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමක් සිදු කර නොමැත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාලව තත්ත්වාගනණය කළ මතයක් ප්‍රකාශකර ඇත.
විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාතමක කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂ වලදී මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනය: බන්ධනාගාර දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය/වත්මන් තත්ත්වය
පළමු කොටස: 76.00	
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	බන්ධනාගාර ආයතන සම්බන්ධයෙන් ඉදිරිපත්වන විගණන විමසුම් සඳහා අදාල ආයතනවලින් තොරතුරු ගෙන්වාගෙන පිළිතුරු සකස් කිරීමේදී ලබාදෙන කාලය ප්‍රමාණවත් නොවන හෙයින්, අදාල කාලසීමාව තුල අතුරු පිළිතුරක් ලබාදීමට කටයුතු කරන අතර, හැකි සෑම අවස්ථාවකදීම ලබාදී ඇති කාලය තුල පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය	ආයතන වලින් තොරතුරු කැඳවා නියමිත කාලය තුල පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සියලු භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නියමිත කාල වකවානුව තුල භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳව වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියලුම බන්ධනාගාර ආයතන භාවිත කරන වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සඳහා වන උපදෙස් ලබාදී ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ඇති වාහන අතුරින් අපහරණය කලයුතු වාහන සියල්ලම මේ වන විට අපහරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර, අයිතිය පවරාගැනීමට නොහැකිව ඇති වාහන එම හේතුව නිසාවෙන් අපහරණය ප්‍රමාදවී ඇති නමුත් වාහනවල අයිතිය පවරාගත් වහාම අදාල කටයුතු සිදුකරනු ලැබේ.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතුකර නොතිබුණි.	මේ වනවිට මු.රෙ.110 ප්‍රකාරව අදාල ආකෘතිය යටතේ නිවැරදි හානි පාඩු ලේඛණයක් ආරම්භ කර නිසිලෙස ලේඛණ යාවත්කාලීන කරමින්, මු.රෙ. ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ 2015 වර්ෂයට පෙර අයකර ගැනීමට ඇති රු.15,120,356.05 ක ණය ශේෂයක් කපාහැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. රු.10,834,218.33 හිඟ ණය ශේෂ ගිණුම්කරණ දෝෂ හේතුවෙන් හටගෙන ඇති බවට හඳුනාගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලබාගැනීම සඳහා අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලිපි ඉදිරිපත් කර ඇත. අනෙකුත් හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. අත්තිකාරම් බී ගිණුමේ පවතින හිඟ ණය ශේෂයෙන් ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අදාල කාර්යය නිමකල විගස එම තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු බවට නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම්	විදේශ ආධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	
විදේශ ප්‍රධාන ලෙස ලැබී තිබුණු සියලු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	විදේශ ප්‍රධාන ලෙස ලැබෙන මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.
දෙවැනි කොටස: 75.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කල මතයක් ලබාදී ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
සියලු නිලධාරින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	සියලු නිලධාරින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.
නිලධාරින්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරින්ගෙන් රජයට යම් පාඩුවක් සිදුවුවහොත් මු.රෙ.156 (1) ප්‍රකාරව අය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මගහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස : 77.00	
2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේදී මිලදී ගත් ස්ථාවර වත්කම් හා අපහරණය කළ ස්ථාවර වත්කම් CIGAS වැඩ සටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන වත්කම් ප්‍රධාන ලෙජර් ගිණුම් අංක 9151, 9152, 9153, යටතේ ගිණුම් ගත කර ඇත. ඒ අනුව එම ලෙජර් ගිණුම් අංක යටතේ 2023 වර්ෂයේ ඉදිරියට ගෙන ආ ශේෂය නිවැරදි අතර වර්ෂය තුල අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් නිවැරදිව ගිණුම් ගත කර අවසාන ශේෂය නිවැරදිව ඉදිරියට ගෙනගොස් ඇත. වත්කම් ලේඛනය (Asset List) මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශය(Non-financial Asset Accounts Summary – SA - 80), මාසික වත්කම් ගිණුම (Asset Account for the Month) හා වාර්ෂික අවසාන ගිණුම් සඳහා වත්කම් වාර්තාව(Asset Report for the Final Account for the Year) එකිනෙක සමග යාවත්කාලීනය පවත්වාගෙන ගොස් ඇත. ඒ අනුව එම තත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.
විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	2023 වර්ෂය සඳහා ලැබුණු විගණන විමසුම් නියමිත දින ඇතුළත්ව විගණන විමසුම් ලේඛණයේ ඇතුළත්කර ඇත. එම විගණන විමසුම් ලේඛණය විගණන නිලධාරීන් විසින් අත්සන් තබා ඇත්තේ යාවත්කාලීන කර නොමැති බව සඳහන් කරමින් වේ. කෙසේ වුවද විමසුම් ලේඛණය 2023 වර්ෂයද ඇතුළත්ව අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්නාගෙන නැත.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට විෂය නිලධාරියාට උපදෙස් ලබා දී ඇත. දැනට මු.රෙ. 104 පරීක්ෂණ මණ්ඩල පත්කර ඇති වාර්තා ලැබීමට නියමිත අනතුරු සම්බන්ධ අවසන් වාර්තාව ලද පසු හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට සටහන් කර ගනිමි.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට එම තත්ත්වය නිවැරදි කර ගන්නා ලදි.
වාර්ෂික ප්‍රම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට එම තත්ත්වය නිවැරදි කර ගන්නා ලදි.

අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2023 වර්ෂයේ දී ලැබුණු අභ්‍යන්තර විගණන විමසුම සඳහා මසක් ඇතුළත පිළිතුරු සැපයීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද 2024 වර්ෂයේ සිට අභ්‍යන්තර හා රජයේ විගණන විමසුම් සියල්ලටම මසක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත.
මු.රෙ. 134(2) අනුව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියල කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සඳහා වන අභ්‍යන්තර විගණක තනතුර 2023 වර්ෂය පුරාම පුරප්පාඩු වී පැවතිණි. තවද මේ වන විටත් එම තනතුර පුරප්පාඩු වී ඇත. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ආවරණය කරන අතර එය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන වැඩසටහන තුල අන්තර්ගත වේ.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023,2024,2025 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණය වාර්තා පිළිවෙලින් 2024.05.10, 2025.03.03 හා 2026.03.31 දින වල විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ ඉඩකඩ ප්‍රමාණවත් නැති අවස්ථාවක් වුවද අත්‍යාවශ්‍ය පරීක්ෂණකටයුතු කඩිනම් කරගැනීම සඳහා විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කර ගැනීමට කටයුතු කිරීමේදී විද්‍යාගාර අතර උපකරණ නැවත ස්ථානගත කිරීමක් සිදුව ඇත. මෙම හේතුව මත තාවකාලිකව ඇතිවූ මෙම තත්ත්වය නිරාකරණය කර ගනිමින් 2025 වර්ෂයේ ද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මේවන විට ඉදිරිපත් කර ඇත. එම නිර්දේශ අනුව කටයුතු කරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සම්බන්ධ 2025 වර්ෂයේ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2026 වර්ෂයේ අදාල වාර්තා මාසිකව යොමු කිරීමට විෂය නිලධාරියාට උපදෙස් ලබා දී ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශනය කිරීමට කමිටු පත් කර ඇත. කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු කරමින් පවතී.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශයේ විශ්ලේෂණ ගාස්තු ලෙස අනුමාණ කළ හැකි ඍජුවම බැංකුව වෙත ලැබී ඇති ප්‍රේෂණ වේ. මෙම ලැබීම්වලට අදාලව ගෙවීම් කළ පුද්ගලයා හඳුනාගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති නිසා ගිණුම් ගත කළ නොහැකිව ඇත. තවද මෙම ප්‍රේෂණ සම්බන්ධයෙන් පවතින වෙනත් තොරතුරු ඇත්නම් ලබා දෙන ලෙස ඉල්ලීම් කීපයක්ම බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව යොමු කළ අවසාන ලිපියට මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. එම පිළිතුර ලද පසු ඒවා ගිණුම් ගත කිරීම හෝ රජයේ ආදායමට යොමු කිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට යලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මු.රෙ. 94(1) අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීමට නොහැකි බැවින් මු.රෙ. 94(2) අනුව ලැබී ඇති ප්‍රතිපාදන ඉක්මවා නොයන ලෙස අත්‍යාවශ්‍ය දෙපාර්තමේන්තු කටයුතු වලට අවශ්‍ය ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් බැරකම්වලට එළඹී ඇත. අත්‍යාවශ්‍ය සැපයුම් සඳහා වන වියදම් මාසිකව සිදු කිරීමෙන් තොරව අත්‍යාවශ්‍ය මහජන සේවා පවත්වාගෙන යාමට නොහැකි බැවින් ඉහත පරිදි කටයුතු කර ඇත.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුනි.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරන අවස්ථාවලදී ඒවා දින 10ක් ඇතුළත පියවීමට කටයුතු කරන ලෙස එම නිලධාරියා ලිඛිතව දැනුවත් කර ඇත. කෙසේ වුවද නිලධාරීන් අපරාධ ස්ථානීය පරික්ෂාව සඳහා යාම හා විශේෂඥ සාක්ෂි සැපයීම සඳහා යාම වැනි කරුණු මත තත්ත්කාර්ය අතුරු අග්‍රිම කීපයක් නියමිත දින වකවානු තුළ පියවීම් කර නොතිබුණි. ඉදිරියේද මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.
<u>දෙවැනි කොටස : 62.00</u>	
ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන	ආයතනය පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම දෙපාර්තමේන්තුව මඟින් 2025.06.15 දින සිට වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලැබේ.

ගොස් නොතිබුණි.	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 වර්ෂයේදී පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත. පුරවැසි ප්‍රඥප්තිය ප්‍රකාරව ආයතනය වෙත ලැබෙන අභියාචනා සම්බන්ධව මහජනතාවට පිළිතුරු යැවීමට කටයුතු කර ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	දෙපාර්තමේන්තු නිලධාරීන් දේශීය හා විදේශීය පුහුණු සඳහා යොමු කිරීමට තෝරා ගැනීම සඳහා පුහුණු කමිටුවක් පත් කර ඇත. පසුගිය වර්ෂවල නිලධාරීන් ලබා දුන් පුහුණු අනුව ලේඛනයක් දැනට සකස් කර ඇත. ඒ අනුව පුහුණු සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ / ව්‍යාචන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත්තේ තත්ත්වාගණනය කළ මතයක් වේ.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාතමක කර නොතිබීම.	විගණනය විසින් පෙන්වා දුන් නිර්දේශ ක්‍රියාත්මක කර වඩා හිතකර විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස සියළුම අංශ දැනුවත් කර ඇත.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරීන් විසින් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී එළඹ ඇති ගිවිසුම් උල්ලංඝනය කිරීම මත අය විය යුතු ගිවිසුම් ගාස්තු හා රජයේ ප්‍රතිපාදන මගින් විදේශ පශ්චාත් අධ්‍යාන පාඨමාලාවන්වලට සහභාගී වී නැවත දෙපාර්තමේන්තුව වෙත සේවයට වාර්තා නොකිරීම නිසා අය කළ යුතු දෙපාර්තමේන්තුව දරා ඇති වියදම් ආදී අයකිරීම් වාරික වශයෙන් අයකර ගනී.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: **492**

ආයතනයේ නම: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මගහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස: 96	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2018 වර්ෂයෙන් පසු සෑම වර්ෂයකදීම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරනණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	2018 වර්ෂයෙන් පසු සෑම වර්ෂයකදීම මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කිරීමට කටයුතු කර ඇත.
දෙවැනි කොටස: 95	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සෑම වර්ෂයකදීම පිරිසිදු මතයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ
මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම -2023 මුදල් වර්ෂය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම: ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

<table>
<tr><td>කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා</td><td>එම දුර්වලතාවයන් මඟහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්</td></tr>
<tr><td colspan="2">පළමු කොටස : 92.00</td></tr>
<tr><td>අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.</td><td>මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් වාර්ෂිකව අභ්‍යන්තර විගණනයක් දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරනු ලබයි.

ඒ අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අවදානම් ලේඛණයට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් වේ.</td></tr>
<tr><td>අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.</td><td>2023 වර්ෂයේ පහත සඳහන් පරිදි විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.
<table><tr><td>විගණන වාර්තා එවූ දිනය</td><td>පිළිතුරු සැපයූ දිනය</td></tr><tr><td>2023.01.12</td><td>2023.01.13</td></tr><tr><td>2023.01.31</td><td>2023.02.01</td></tr><tr><td>2023.02.01</td><td>2023.02.02</td></tr></table></td></tr>
</table>

<table>
<tr>
<td></td>
<td>
<table>
<tr><td>2023.03.13</td><td>2023.03.21</td></tr>
<tr><td>2023.03.10</td><td>2023.04.04</td></tr>
<tr><td>2023.03.21</td><td>2023.04.03</td></tr>
<tr><td>2023.03.24</td><td>2023.04.20</td></tr>
<tr><td>2023.05.04</td><td>2023.05.10</td></tr>
<tr><td>2023.06.28</td><td>2023.09.21</td></tr>
<tr><td>2023.04.21</td><td>2023.11.09</td></tr>
</table>

උක්ත 2023.04.21 දිනැතිව අප වෙත ලැබී ඇති විගණන විමසුම සඳහා අතපසුවීමකින් පිළිතුරු සපයා නැත. 2023.10.25 දිනැතිව ඒ සම්බන්ධව ලැබුණු සිහිකැඳවීම් ලිපිය අනුව 2023.11.09 දින ඒ සඳහා පිළිතුරු සපයා ඇත. මේ වන විට විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සපයා ඇත.
</td>
</tr>
<tr>
<td>අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.</td>
<td>2021.11.11 දින , 2021.12.06 දින සහ 2023.06:21 දිනැතිව සංවර්ධන නිලධාරි තනතුරු 09 ක් අනුමත කර ගැනීම සඳහා මු.රෙ 71 ප්‍රකාරව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. 2023.01.01 දිනට අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 05කි.

2021 වර්ෂයේ නව ශාඛා ඇතිකිරීමේ අරමුණින් අභ්‍යාසලාභී පුහුණුවන සංවර්ධන නිලධාරි 11 දෙනෙක් (2021.01.03 සහ 2022.04.01) රාජ්‍ය සේවයට බඳවා ගත්, (2022.01.03 සිට 2022.04.01 දින යන</td>
</tr>
</table>

<table>
<tr><td></td><td>කාලය තුළ පත්වීම් ලද) මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත.

2023.12.21 දිනට සංවර්ධන නිලධාරී තනතුරු 13ක් අනුමත කර ඇත.

ඒ අනුව 2023.12.31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 18 ක්වන අතර, තත්‍ය සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 18 වේ.

• 2026.05.31 දින වන විට අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 18කි. තත්‍ය සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 15කි. පුරප්පාඩු සංඛ්‍යාව 03කි.</td></tr>
<tr><td colspan="2">දෙවැනි කොටස: 85.00</td></tr>
<tr><td>සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50% අඩු මට්ටමක පැවතුණි.</td><td>ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා, වාර්ෂික කාර්ය සාධනය අනුව 90% ක ප්‍රගතියක් දක්වා ඇත.
<table><tr><td>ලැබුණු ප්‍රතිපාදන</td><td>වියදම</td></tr><tr><td>100,000/-</td><td>90,000/-</td></tr></table></td></tr>
<tr><td>ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / වෘාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.</td><td>2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන විගණකාධිපති මතය තත්ත්වාගණනය කල මතයකි.</td></tr>
</table>

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම : ශ්‍රී ලංකා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

කමිටුව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය/වත්මන් තත්ත්වය
පළමු කොටස: 85.00	
2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව CIGAS වැඩ සටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	2024 වර්ෂයේ සිට සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් වාර්ෂිකව අභ්‍යන්තර විගණණයක් දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරනු ලබයි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අවධානම් ලේඛණයට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් වේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	නිසි කාලසීමාව තුළ පිළිතුරු සපයා ඇති බව කාර්යාලීය ලිපි ගොනු පරීක්ෂාවේදී තහවුරු විය. ඉන් පසු වසර වලදීද අවසන් දිනයට පෙර පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 මුදල් වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කොට සමීක්ෂණ වාර්තාව 2023/03/21 දින විගණධිපති වෙත යොමු කොට ඇති අතර එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද භාණ්ඩ වෙන්දේසිය 2023/04/04 දින සිදු කොට ඇති බව ගොනු පරීක්ෂාවේදී තහවුරු විය.ඒ අනුව දින 04ක ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඉදිරි වසර වලදී චක්‍රලේඛය ප්‍රකාරව හැකි උපරිමයෙන් කටයුතු සිදු කෙරෙමින් පවතී.
අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත්	මේ වන විට අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු

සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාරය මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	කර ඇත.
දෙවැනි කොටස: 64.00	
ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2023 වසරේදී ආයතනික වෙබ් අඩවිය තාක්ෂණික දෝෂයක් මත අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එය නැවත සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව සතුව නොතිබීම නිසා 2024 වසරේ අයවැයෙන් අදාළ ප්‍රතිපාදන ලබාගෙන එය නැවත යාවත්කාලීන කර ක්‍රියාත්මක මට්ටමට ගෙන එන ලදී. (Revamping) වර්තමානය වන විට මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා විවෘතව පවතී.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	2024 වසරේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමෙන් අනතුරුව මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වසරේ මෙම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 15 දෙනෙක් සේවයේ නිරත වූ අතර ඔවුන්ගේ විෂය පථයට ගැළපෙන පුහුණු අවස්ථා සඳහා පමණක් සහභාගී විය. නිළධාරීන්ගේ විෂය පථය ආවරණය වන පුහුණු අවස්ථා සඳහා හැකි තරම් ඔවුන් යොමු කිරීමට කටයුතු කෙරෙමින් පවතී.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත් මට්ටමේ / ව්‍යාචන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ ආයතනය වෙත ලැබී ඇත්තේ තත්වාගණනය කළ මතයකි.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධක දර්ශක 04 ක් හඳුනාගෙන ඒ අනුව කටයුතු කෙරෙමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම: ප්‍රජාපාදක විශෝධක දෙපාර්තමේන්තුව

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මඟහරවාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වයන්
පළමු කොටස : 83.00	
2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේවන විට යාවත්කාලීන කර ඇත.
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් වාර්ෂිකව අභ්‍යන්තර විගණණයක් දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරනු ලබයි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අවධානම් ලේඛණයට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් කර ඇත.
වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලසම, විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකස් කර නිසි අනුමැතිය ලබාගෙන ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු	මේ වන විට විමසුම ලැබී මාසයක්ඇතුලත අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු

නොසැපයූ අවස්ථා වාර්තා විය.	කර ඇත.
මු.රෙ 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක නොවන බැවින් අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් වාර්ෂිකව අභ්‍යන්තර විගණණයක් දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදු කරනු ලබයි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අවධානම් ලේඛණයට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් වේ.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිළදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත එම වර්ෂයට අදාල වත්කම් මිලදීගැනීමේ හා අපහරණය කිරීමේ තොරතුරු ඉදිරිපත් කර ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂයකම ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කර නිසි දිනට විගණකාධිපති වෙත වාර්තා යොමු කිරීමට කටයුතු කරනු ලබයි.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසු අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශ සහ අනෙකුත් නිර්දේශ නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.
සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මේ වන විට සංචිත වාහන තුනෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.

නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	වර්තමානයේ දී වෙනත් ආයතන වෙත අවසන් කාර්තුවේදී ප්‍රතිපාදන පැවරීමක් සිදු නොකෙරේ.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් නිලධාරීන් දැනුවත් කර ඇති අතර, මෙම තත්ත්වය හැකිතාක් දුරට වලක්වා ගැනීමට කටයුතු මේවන විට සිදු කර ඇත.
දෙවැනි කොටස : 51.00	
ආයතනය පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම වෙබ් අඩවියක් පවත්වාගෙනගොස් නොතිබුණි.	දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමට 2026 අයවැය මගින් රු.මි. 05ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර ඒ අනුව වෙබ් අඩවිය නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු වන තාක්ෂණ සහ ලංසු කමිටු පත්කර මේ වන විට කමිටු වාර්තා අපවෙත ලැබී ඇත. ඒ අනුව සුදුසුකම් සහිත ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි /සේවා ලාභි ප්‍රඥප්තිය නිසි පරිදි පිළියල කර ප්‍රාදේශිය කාර්යාල වල ප්‍රදර්ශනය කර ඇත.
ආයතන්යේ පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳව අධික්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ක්‍රියාත්මක කිරීමේ කිසියම් ගැටළුවක් පවතීනම් ඒ බව දැනුම් දීම සඳහා ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් ඇතුළු නිලධාරීන්ගේ දුරකථන අංක පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය ඇතුලත් දැන්වීමේ සඳහන් කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2023.09.05 දිනැතිව ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා සකස් කරන ලද කාර්යය සාධන ගිවිසුම් අත්සන සඳහා යොමු කර ඇත. ඉන් පසුව රා.ප.ච.02/2018(1) නිකුත් වීම මත් එම චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලදී.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) අනුව 2024 -2029 දක්වා වූ කාලය සඳහා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත් මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023.12.31 දිනේ අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ මතය යටත් මට්ටමේ මතයකි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ බොහොමයක් මේවන විට ඉටුකර ඇත

ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.